# ලංකා බැංකුව

**ලංකා බැංකුව යනු ලන්ඩනයේ බැංකු අනුබද්ධිත ආයතනයක් ඇතුළු විදෙස් රටවල් ගණනාවක ක්‍රියාත්මක වන, දිවයින පුරා ශාඛා ජාලයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව යි.**

**ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුව ද වන අප පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සහිත පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# <u>අභ්‍යාසලාභී සංවර්ධන සහකාර</u>

**(මෙම තනතුර සඳහා පුරප්පාඩු පවතින්නේ මධ්‍යම, නැගෙනහිර, උතුරු මැද, වයඹ, උතුරු, සබරගමුව සහ ඌව පළාත්වල පමණකි)**

## යෝග්‍යතා නිර්ණායක

1. **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**
2. **සුදුසුකම්**
   - ➢ අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී මව්බස, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 කින් (අතිරේක විෂයයන් හැර) සමත් වී තිබීම.

     සහ

   - ➢ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී විෂයයන් 3කින් (සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය දැනුම හා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හැර) එක් වරකදී සමත් වී තිබීම.

     සහ

   - ➢ අවම වශයෙන් රජයේ ආයතනයකින් ලබාගත් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය (අවම වශයෙන් වසර දෙකක පූර්ණ කාලීන පාඨමාලාවක් විය යුතුය.)

     හෝ

     තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ඕනෑම පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ අවම වශයෙන් අවුරුදු දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් (NVQ 5 හෝ ඊට වැඩි) සමත් වී තිබීම.
3. **යතුරුපැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.**
4. **වෙනත් ගුණාංග**
   - ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල සම්බන්ධතා සහ සන්නිවේදන හැකියාව
   - දැඩි උත්සාහය සහ කැපවීම සහිත පුද්ගලයකු වීම
   - කාලානුබද්ධ ඉලක්ක අනුව සේවයකිරීමේ හැකියාව
5. **වයස**

   අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 28 හෝ ඊට අඩු විය යුතුය.

## නියමයන් සහ කොන්දේසි

- ➢ පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර මෙම පුහුණු කාලය තුළ මාසික දීමනාවක් (පළමු වසර සඳහා - මසකට රු.60,000/- ක් ද දෙවන වසර සඳහා - මසකට රු.75,000/- ක් ද) ගෙවනු ලැබේ.
- ➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- ➢ පුහුණු කාලසීමාව තුළ බැංකුව සෑහීමකට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර කාර්ය මණ්ඩලයේ සංවර්ධන සහකාර - 1 ශ්‍රේණියෙහි ස්ථිර කරනු ලැබේ.
- ➢ කළමනාකාරිත්වය විසින් වෙනත් ආකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, අභ්‍යාසලාභීන් අවම වශයෙන් අවුරුදු දහයක (10) අනිවාර්ය කාල සීමාවක් (පුහුණු කාලය ද ඇතුළුව) තමාට අනුයුක්ත කර ඇති පළාතේ සේවය කළ යුතුය.

## තෝරා ගැනීමේ පටිපාටිය

- ➢ ඉහත යෝග්‍යතා නිර්ණායක අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.
- ➢ තෝරාගැනීම් අදාළ පළාත් හතෙහි අවශ්‍යතා මත පදනම් වේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

ඔබේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන **www.boc.lk** ("careers" තීරය) හරහා **2025 ජූලි මස 26 වන දින හෝ ඊට පෙර** ඉදිරිපත් කරන්න. ඉදිරි කටයුතු සඳහා **"අයදුම්පතේ යොමු අංකය"** ඔබේ ළඟ තබාගන්න.

මෙම තනතුර සඳහා පුරප්පාඩු පවතින්නේ මධ්‍යම, නැගෙනහිර, උතුරු මැද, වයඹ, උතුරු, සබරගමුව සහ ඌව පළාත්වල පමණක් බැවින් අයදුම් කිරීමේදී අපේක්ෂකයන් තමන් කැමති එක් පළාතක් පමණක් සඳහන් කළයුතු අතර, යම් අපේක්ෂකයකු පළාත් එකකට වඩා සඳහන් කරන්නේ නම්, ඔහුගේ/ඇයගේ අයදුම්පත නුසුදුසු ලෙස සලකනු ලැබේ.

ඉහත ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමවේදයන්ගෙන් ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ භාරගනු නොලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අවසන් ප්‍රතිඵල ලැබී නොමැති හෝ සුදුසුකම් බලපවත්වන දිනය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව යෙදී ඇත්නම් හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම අයදුම්පතක් බඳවාගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවකු විසින් සහතික පරීක්ෂා කරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සනාථ කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කරුණාකර Careers Page හි ඇති 'අපේක්ෂකයන් සඳහා වන උපදෙස්' සැලකිල්ලෙන් යුතුව කියවා, දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.

ඉල්ලුම්කරු විසින් අපගේ වෙබ් අඩවියේ (**https://www.boc.lk/hr-management**) ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ ඇති **"බඳවාගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම"** ඉල්ලුම්කරන අවස්ථාවේදී කියවා එය පිළිගත යුතුය.


**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**කොළඹ 01.**


- ▪ බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.
- ▪ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- ▪ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- ▪ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.